# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2023 අංක 7 දරන
## සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2023 ජූනි මස 27 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2023 ජූනි මස 30 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2023 අංක 7 දරන
## සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2023 ජූනි මස 27 වන දින]

එල්.ඩී.-ඕ 35/2021

**(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2023 අංක 7 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 431 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ සංග්‍රහයේ 431අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:- 101 වන අධිකාරයට 431අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**"ඇ.- වෛද්‍ය පරීක්ෂණ සඳහා අධිකාර පත්‍ර**

වෛද්‍ය පරීක්ෂණ සඳහා අධිකාර පත්‍ර

431අ. (1) (අ) නඩුව, තැනැත්තකුට සිදු වූ තුවාල සඳහා අලාභ ලබා ගැනීම පිණිස පවරා ඇති නඩුවක් වන අවස්ථාවක දී, අධිකරණය විසින්, යම් පාර්ශ්වකරුවකු විසින් කරනු ලබන ඉල්ලීම මත සහ අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියමවලට සහ කොන්දේසිවලට යටත්ව, අධිකරණය විසින් නම් කරනු ලබන එක් වෛද්‍ය වෘත්තිකයකු හෝ ඊට වැඩි දෙනකු විසින්, එහෙත් තිදෙනකු නොඉක්මවන වෛද්‍ය වෘත්තිකයන් සංඛ්‍යාවක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජන වන ලෙස තුවාල ලත් තැනැත්තාට ආඥාවක් කළ යුතු ය.

(ආ) ඒ පරීක්ෂණයෙන් අනතුරුව එහි වාර්තාව, නිශ්චිතව දක්වනු ලැබිය හැකි දිනයක හෝ එදිනට පෙරාතුව අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය. අධිකරණය විසින්, එක් එක් පාර්ශ්වකරු වෙත ඒ එක් එක් වාර්තාවේ පිටපතක් වහාම භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

(2) නඩුවක යම් පාර්ශ්වකරුවකු විසින් තෝරා ගනු ලබන එක් වෛද්‍ය වෘත්තිකයකු හෝ ඊට වැඩි

දෙනකු, නිරීක්ෂකයකු හෝ නිරීක්ෂකයන් ලෙස ඒ පාර්ශ්වකරු විසින් ඒ පරීක්ෂණයට ගෙන්වා ගනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ අධිකරණයේ ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම තුවාල ලත් තැනැත්තා විසින් පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, නඩුවේ සියලු අවස්ථානුගත කරුණු සැළකිල්ලට ගෙන ඒ පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හේතුකොටගෙන ඒ තැනැත්තාට විරුද්ධව නිසි ලෙස එළඹිය හැකි සියලු අනුමිතිවලට එළඹීමට අධිකරණයට හිමිකම් ඇත්තේ ය.

(4) ඒ වාර්තාව හෝ වාර්තා වැඩිදුර ඔප්පු කිරීමකින් තොරව ම එහි ප්‍රකාශිත සිද්ධි පිළිබඳ සාක්ෂි වශයෙන් නඩු විභාගයේ දී භාවිත කළ හැකි ය:

එසේ වුව ද, නඩුවේ යම් පාර්ශ්වකරුවකු විසින් කරනු ලබන ඉල්ලීම මත සහ අධිකරණය විසින් ගාස්තු සම්බන්ධයෙන් හෝ අන් දෙයක් සම්බන්ධයෙන් නිශ්චය කරනු ලැබිය හැකි නියම මත, ඒ වෛද්‍ය වෘත්තිකයා කැඳවා ඒ වාර්තාවෙන් හෝ ඒ වාර්තාවේ වූ යම් සිද්ධි ප්‍රකාශයකින් හෝ ඒ වාර්තාවෙන් අත් හැරී ඇතැයි යම් පාර්ශ්වකරුවකු විසින් කියනු ලබන යම් අදාළ සිද්ධියකින් පැන නගින හෝ ඒ හා සම්බන්ධ යම් කරුණක් පිළිබඳව වාචිකව පරීක්ෂා කරන ලෙස අධිකරණය විසින් ආඥාවක් කළ යුතු ය.

(5) සෑම අධිකරණයක් විසින් ම, (1)(අ) උපවගන්තිය යටතේ වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ආඥාවක් කරනු ලැබීමට හැකියාව ඇති, ඒ අධිකරණ බල ප්‍රදේශය ඇතුළත පදිංචිව සිටින හෝ වෛද්‍ය වෘත්තියේ නිරතව සිටින වෛද්‍ය වෘත්තිකයන්ගේ ලැයිස්තුවක් කලින් කලට සකස් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අධිකරණය විසින්, ඒ ලැයිස්තුවෙහි යම් වෛද්‍ය වෘත්තිකයකුගේ නම ඇතුළත් කිරීමට

පෙරාතුව, ඒ වෛද්‍ය පරීක්ෂණය සිදු කිරීමට භාර ගැනීම සඳහා සාමාන්‍යයෙන් ඒ වෛද්‍ය වෘත්තිකයාට හැකියාව පවතින්නේ ද යන්න නිශ්චය කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි වන විමසීම් සිදු කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා "වෛද්‍ය වෘත්තිකයා" යන්නෙන්, (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති වෛද්‍ය වෘත්තිකයකු අදහස් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.